# විද්‍යා සාක්ෂරතාවය තුළින් වැඩ ලොවට









එම්.බී.ඉරෝෂිකා බණ්ඩාර

මිනිස්බල සැලසුම් හා සංවර්ධන හා පර්යේෂණ අංශය

## විද්‍යා සාක්ෂරතාවයේ වැදගත්කම

දැනුම රටක වර්ධනය හා සංවර්ධන ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍යම සාධකයකි.ආර්ථික විද්‍යාව හා තාක්ෂණය නවෝත්පාදන පර්යේෂණ සංවර්ධනය සමඟ එකට බැඳී පවතියි. 4 වන කාර්මික විප්ලවයට සූදානම් වන ලෝකය ආර්ථික වර්ධනය සඳහා විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රගතිය ඉහළම සන්ධිස්ථානයක් ලෙස ඔසවා තැබීම ආරම්භ කර තිබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සේම ජෛව තාක්ෂණයේ නවෝත්පාදනයන් සඳහා විද්‍යා සාක්ෂරතාවයට මූලිකත්වය දෙනු ලබයි.අනාගත තාක්ෂණ ලෝකය තුළට ප්‍රවිශ්ඨ වීමට ශ්‍රී ලංකාවේද විද්‍යාව හා විද්‍යාව පදනම් කරගත් තාක්ෂණය පිළිබඳ දැනුම සමඟ විද්‍යාත්මක සාක්ෂරතාවය වෙත යොමු වීම ඉතාම වැදගත් වෙයි. එමඟින් තිරසාර නිෂ්පාදන හා සේවා සඳහා ඇති ඉල්ලුම මඟින් ද නව රැකියා අවස්ථා උත්පාදනය කළ හැකිය.

## විද්‍යාව හා තොරතුරු තාක්‍ෂණය සඳහා ඇති ඉල්ලුම සහ සැපයුම අතර පරතරය

වෙළඳපොළට සරිලන ලෙස ශ්‍රම ඉල්ලුම හා සැපයුම අතර වෙනස අවම කිරීමට නම් කුසලතා සහිත උගත් ශ්‍රම බලකායක් අවශ්‍ය වෙයි.ශ්‍රී ලංකාවේද ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදුවීම හේතුවෙන් තාක්ෂණික දැනුමෙන් යුතු ශ්‍රමික ඉල්ලුමට මූලිකත්වය ලැබෙයි.දළ දේශීය නිෂ්පාදන සංයුතිය ඉහළ යාමට කෘෂිකාර්මික අංශය නිෂ්පාදන හා සේවා බවට පරිවර්තනය වීම,තාක්ෂණික දැනුම මත රැඳුන ශ්‍රම බලකායක් සපිරි කර්මාන්ත වෙත යොමු වීම,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය පුළුල් කිරීම මෙයට ඇතුළත් ය.සංවර්ධිත ආර්ථිකයක් කරා පරිවර්තනය වීමට තාක්ෂණික කාර්යක්ෂමතාවයෙන් යුතු ශ්‍රමික ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළ යනු ඇත. උදාහරණ ලෙස ප්‍රවාහන හා සන්නිවේදනයේ 2010 සිට 2020 දක්වා රැකියා ඉල්ලුම 73.6% කින් ද මූල්‍ය සේවා අංශය 81.6% කින් ද ඉහළ යනු ඇතැයි ජාත්‍යන්තර කම්කරු සංවිධානය ගණන් බලා තිබේ.

සංචාරක ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය වර්ධනය වීමට නම් සේවා සපයන්නන් ඩිජිටල් තාක්ෂණයට පිවිසීම ආදිය දැක්විය හැක.ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 26.8%(2018)[1] ක් පමණක් අන්තර්ජාලය භාවිතා කරයි. මෙය වේගයෙන් ඉහළ යාමක් වන අතර අනෙකුත් දකුණු ආසියානු ආර්ථිකයන්ට වඩා ඉහළ අගයක් ගන්නා අතර එය මැලේසියාව, තායිලන්තය සහ වියට්නාමය වැනි සංසන්දනාත්මක ආර්ථිකයන්ට වඩා සැලකිය යුතු ලෙස අඩුය.

ශ්‍රී ලංකාවේ ජාතික පරිගණක සාක්ෂරතා අනුපාතය 2018 දී 29%[2] ක් වේ. කෙසේ වෙතත්, ජංගම දුරකථන ග්‍රාහක මිලියන 32 කට අධික සංඛ්‍යාවකට (ජනගහනයෙන් 70% ) ජංගම දුරකථනයක් තිබේ.ජංගම ජාලයන් රටේ ජනගහනයෙන් 95% ක් ආවරණය කරයි. තාක්‍ෂණික යටිතල පහසුකම් සහ භාවිතයේ ඇති විෂමතාවයට බොහෝ දුරට හේතු වී ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ආංශීය විෂමතා වැනි ව්‍යුහාත්මක සාධක නිසා ය. උදාහරණයක් ලෙස, අන්තර්ජාල භාවිතය සඳහා ස්ත්‍රී පුරුෂ පරතරය 40% ක් තරම් ඉහළ අගයක් ගනී. නාගරික (36.9%), ග්‍රාමීය (22.0%) සහ වතු 8.6% ක් ලෙස අංශ අතර තොරතුරු තාක්ෂණ සාක්ෂරතා මට්ටම්වල සැලකිය යුතු විෂමතා පවතී.මෙම විෂමතාවන් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ ඩිජිටල් සූදානමේ සැලකිය යුතු ව්‍යුහාත්මක දුර්වලතා ය.

ශ්‍රම වෙළඳපොල දෙස අවධානය යොමු කිරීමේදී තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ක්ෂේත්‍ර වල සේවකයින්ගේ හිඟයක් පවතින බව පෙනී යයි.. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිධාරීන් සඳහා ඇති ඉල්ලුම **2014** දී **6,246** සිට **2019** දී **21,216** දක්වා ඉහළ ගොස් තිබේ.සැපයුම **9076**[3] කි

[1] Computer Literacy Statistics 2018 Annual Bulletin –department of census and statistics

[2] - do -

[3] National IT –BPM Workforce Survey 2019

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ ඉල්ලුම හා  සැපයුම අතර පවතින පරතරය ද මින් පැහැදිලි වෙයි.

 තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ක්ෂේත්‍රවල සේවකයින්ගේ හිඟයක් පැවතුනත් කලා විෂය ක්ෂේත්‍රයේ උපාධිධාරීන් බහුතරයක් විශ්ව විද්‍යාල තුළින් බිහි වන අතර ඔවුන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතය ඉතාම අඩු මට්ටමක පවතියි.පාසැල් මට්ටමින් විද්‍යා, ගණිතය විෂයයන් සඳහා උසස් පෙළ හදාරන්නේ සිසුන්ගෙන් සුළු ප්‍රමාණයක් වීම නිසා විශ්ව විද්‍යාල ප්‍රවේශයෙන්  බිහිවන බහුතරය කලා උපාධිධාරීන් වෙයි.

## විෂය පථය අනුව උපාධිධාරින්-2018



4

 2018 වර්ෂයේදී සමස්ත උපාධිධාරින්ගෙන් බහුතරය කලා උපාධිධාරින් වෙයි.එය 12,483ක් පමණ වෙයි.2018 වර්ෂයේදී රැකියා විරහිත උපාධිධාරින්ගෙන් 59.1% ක ප්‍රතිශත අගයක් කලා උපාධිධාරින් වන අතර අනෙක් සියලු  උපාධිධාරින්ගේ ප්‍රතිශතය 40.9% ක්  වෙයි.උපාධිධාරී සේවා වියුක්තියේ බහුතරය කලා උපාධිධාරින් වන බව මින් පැහැදිලි වෙයි.

---

4 www.ugc.ac.lk stat-2018/chapter 04

අංශ අනුව විශ්ව විද්‍යාල උපාධිධාරීන්ගේ වෘත්තීය සංයුතිය



[5]

*pro.-Professionals

ඉහත තොරතුරු අනුව පැහැදිලි වන්නේද අංශ අනුව විශ්ව විද්‍යාල උපාධිධාරීන්ගේ වෘත්තීය සංයුතිය රාජ්‍ය ,අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික සේවා නියුක්තියේ බහුතරය විද්‍යාව සහ ඉංජිනේරු වෘත්තිකයන් වන අතර එය 2015 වර්ෂයේ 13.7% ක ප්‍රතිශතයක් වෙයි. ඒ අනුව පැහැදිලි වන්නේද සහ ශ්‍රම වෙළඳපොල තුළ කලා උපාධිධාරීන්ගේ ඉල්ලුම අඩු වීම තුළ  ඔවුන්ගේ අතිරික්තයක් පැවතීමයි.

## <u>පාසල තුළින් වැඩ ලොවට ප්‍රවිශ්ටය ඇති කිරීම</u>

සිසුන්ගෙන් 52% ක් පමණ කලා හා තාක්ෂණ විෂයයන් තෝරා ගන්නා අතර 27% ක් වාණිජ්‍යය තෝරා ගන්නා අතර ගණිතය හා විද්‍යාව තෝරා ගන්නේ 21% ක් පමණි[6]. විද්‍යා හා ගණිත විෂයයන් සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාව සාපේක්ෂව අඩු වුවද, විද්‍යා උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා කලා හා වාණිජ උපාධිධාරීන්ට වඩා වැඩි වෙයි. 2017  වර්ෂය වන  විට රජයේ පාසැල් 10,194 න් අ.පො.ස  උසස් පෙළ විද්‍යා විෂය ධාරාව ඇත්තේ පාසැල් 1029ක පමණි(10% ).පාසැල් 1818ක කලා සහ වාණිජ විෂයන් ඇත. උසස් අධ්‍යාපන මට්ටමින් විද්‍යා ආශ්‍රිත ක්ෂේත්‍ර සඳහා බහුතර පිරිසකට යොමු වීමට  ප්‍රධාන හේතුව වන්නේ පාසල් මට්ටමේ උසස් පෙළ විද්‍යා විෂය ධාරාවන්ට ඇති ප්‍රවේශයයි.පාසැල තුළ පවතින විෂය ධාරාවේ උසස් පෙළ ඉගැන්වීමේ පහසුකම් අනුව වෙනත් විකල්ප නොමැති වීම හේතුවෙන් බොහෝ සිසුන්ට උසස් පෙළ සඳහා කලා හෝ වාණිජ විෂයයන් හැදෑරීමට සිදු වෙයි. විද්‍යාව හා තොරතුරු තාක්ෂණය වැනි වැඩි ඉල්ලුමක් ඇති විෂයයන් සඳහා භෞතික මෙන්ම මානව සම්පත් විෂමතා පවතී. බොහෝ පාසල්වල ඉතා මූලික පහසුකම් ඇති අතර විද්‍යාගාර, ක්‍රියාකාරකම් කාමර, තොරතුරු තාක්ෂණ පහසුකම් වැනි නවීන ඉගෙනුම් අවශ්‍යතාවන්ට සරිලන පරිදි  අවශ්‍ය සම්පත් නොමැත.

---

[5] Does the Sri Lankan economy need more university graduates? By Ljubica Nedelkoska, Tim O'Brien and Daniel Stock Center for international Development-Harvard University 2018

[6] School Information -2018

**පාසැල් වල පරිගණක පහසුකම්**




ශ්‍රී ලංකාවේ සමස්ත පාසල් සංඛ්‍යාවෙන් පාසල් 5,643 ක (55%) සිසුන්ට පරිගණක පහසුකම් ඇත. පරිගණක පහසුකම් වලින් ඉහළම ප්‍රතිශතය බස්නාහිර පළාතෙන් (69%) වන අතර පරිගණක පහසුකම් වලින් අඩුම ප්‍රතිශතය වයඹ පළාතෙන් වන අතර එය 47% කි.[7] භූගෝලීය විෂමතාවය අනුව සහ සියලුම පාසැල් සඳහා සම්පත් බෙදී යාමේ විෂමතාවය ද විද්‍යාව හා තොරතුරු තාක්ෂණය ඉගෙනීමට සිසුන් යොමු නොවීමට හේතු වෙයි.

[7] School Census 2017 -Ministry of Education



**විද්‍යා සාක්ෂරතාවය පුළුල් කිරීමට නම්........**

* ග්‍රාමීය මට්ටමින් උසස් පෙළ සහිත පාසල් තුළ විද්‍යාව සහ තාක්ෂණ විෂයන් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා පුළුල් කළ යුතුය.

*ඉගෙනීම මෙන්ම ඉගැන්වීමද වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පාසල්වලට ලබා දිය යුතුය.
*ක්‍රියාකාරකම් කාමර, තොරතුරු තාක්ෂණ පහසුකම්, විද්‍යාගාර වැනි භෞතික සම්පත් මෙන්ම ග්‍රාමීය ගුරු හිඟය අවම කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

මෙම අත්‍යවශ්‍ය කුසලතා සඳහා ඉල්ලුම සහ සැපයුම අතර රටේ පරතරය පියවා ගැනීම සඳහා එක් එක් උසස් පෙළ විෂය ධාරාව තුළ මූලික විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / විද්‍යා විෂයයන් වැනි ශ්‍රම වෙළඳපල තුල වැඩි ඉල්ලුමක් ඇති විෂයයන් හඳුන්වා දීමෙන් පාසල හා විශ්ව විද්‍යාල විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීම තුළින් වැඩ ලොවට හැකියාව ඇති පිරිසක් බිහි කළ හැකිය.